ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය ඩිප්ලෝමා වැඩ සටහන - **3** වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**EPD3232/ESD1132 -** විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ - සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්

කාලය - පැය දෙකයි. **(02)**

දිනය - 2023.07.15 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30 දක්වා

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද **(03)** පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "සෞන්දර්ය" යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

02. ළමා චිත්‍ර සහ වැඩිහිටි චිත්‍ර අතර අතර පවතින ප්‍රධාන වෙනස්කමක් දක්වන්න.

03. කතන්දර ක්‍රමය යොදා ගැනීමේ වාසි දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න.

04. බහුවිධ බුද්ධි න්‍යායයෙන් ඉදිරිපත් කරන බුද්ධි හැකියාවන් වර්ග අට **(06)** ලැයිස්තු ගත කරන්න.

05. පෙරපාසලේ ඉගැන්වීමේ - ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා රූකඩ භාවිතයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

06. සංගීතය සහ චලන තුළින් සංවර්ධනය කළ හැකි කුසලතා හතරක් **(04)** සඳහන් කරන්න.

07. මුල් ළමාවිය ළමුන් සඳහා එළිමහන් ඉගෙනුම් පරිසරයක් තිබීමේ වාසි හතරක් **(04)** පැහැදිලි කරන්න.

08. බෲනර් (Bruner) විසින් තොරතුරු සැකසීම සහ නියෝජනය කිරීම සඳහා ඉගෙනුම් ක්‍රම තුනක් (03) හඳුන්වා දී ඇත. එම ඉගෙනුම් ක්‍රම තුන **(03)**මොනවා ද?

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) හොවර්ඩ් ගාඩ්නර් (Howard Gardner) විසින් ඉදිරිපත් කරන ලද බහුවිධ බුද්ධි න්‍යාය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ළමුන් තුළ සංගීත බුද්ධිය උත්පාදනය කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවා දැයි විග්‍රහ කරන්න. (ලකුණු 12)

10. (i) පෙර පාසල් ළමුන් සඳහා සෞන්දර්ය ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී පෙරපාසල් ගුරුවරියක විසින් සැලකිලිමත් විය යුතු වැදගත් කරුණු හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) මුල් ළමාවිය ළමුන්ගේ සංවර්ධනය සඳහා කතන්දර සහ ළමා නාට්‍ය යොදා ගැනීමේ වැදගත්කම උදාහරණ සහිතව විශ්ලේෂණය කරන්න. (ලකුණු 12)

11. (i) නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා භාවිත කළ හැකි ඉවතලන ද්‍රව්‍ය සහ ස්වභාවික ද්‍රව්‍ය දහයක් **(10)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ii) පෙරපාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනයේ දී නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා ඉවත ලන ද්‍රව්‍ය යොදා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 15)

12. (i) "සන්නිවේදනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(ii) "ප්‍රාථමික ගුරුවරුන් ළමුන්ගේ සන්නිවේදන කුසලතා සංවර්ධනය කිරීම සඳහා විවිධ ඉගැන්වීමේ ක්‍රම භාවිත කළ යුතුය."
ප්‍රාථමික ගුරුවරයෙකු වශයෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (i) පෙරපාසල් සහ ප්‍රාථමික මට්ටම් වලදී කතන්දර සහ ළමා නාට්‍ය සඳහා භාවිතා කළහැකි ද්‍රව්‍ය/ආධාරක පහක් **(05)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 08)

(ii) ළමා නාට්‍ය සහ කතන්දර සඳහා ඉහතින් ඔබ දක්වන ලද ද්‍රව්‍ය/ආධාරක යොදා ගන්නා ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.